# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 354/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 28/02/2024<br>පැය 1130 |

## මාධ්‍ය නිවේදනය

**01. පුද්ගලයෙකුට වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අපරාධයක් සඳහා ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2024.02.21 වන දින මහබාගේ පොලිස් වසමේ ඇලපිටිවල හන්දිය අසල මස් වෙළඳසැලක් තුලදී යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය විසින් වැඩිදුර විමර්ශන ආරම්භ කර තිබිණි.

ඒ අනුව මෙම අපරාධය සඳහා සැකකරුවන් ගිනි අවිය සමගින් ප්‍රවාහනය කල ත්‍රිරෝද රථයේ රියදුරු 2024.02.27 වන දින වත්තල පොලිස් වසමේ ලන්සියාවත්ත ප්‍රදේශයේදී ත්‍රිරෝද රථයක් හා හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 200ක් සමගින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42ක් වන මෝදර, කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. සැකකටයුතු මරණයක් - දඹුල්ල පොලිස් වසම.**

2024.02.27 වන දින රාත්‍රී කාලයේ දඹුල්ල පොලිස් වසමේ වැවලවැව ප්‍රදේශයේ නිවසක් තුල සැකකටයුතු ලෙස පුද්ගලයෙකු මියගොස් ඇති බවට දඹුල්ල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ වැවලවැව, දඹුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු විවාහක පුද්ගලයෙකු වන අතර බිරිඳ මරණකරුගෙන් වෙන්වී ඇති බැවින් සිය මව සමග නිවසේ පදිංචිව සිට ඇති බවත්, මව සිද්ධිය වන අවස්ථාවේ නිවසේ නොසිට ඇති බවටද සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය පොලිස් ආරක්ෂාව යටතේ සිද්ධිය වූ ස්ථානයේ ඇති අතර දඹුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**